
# නෙලිවැව එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම




**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක කාර්යාලය - වයඹ පළාත**

| | | |
|---|---|---|
| 1 | හැඳින්වීම.......................................................................................... | 4 |
| 1.1 | නෙලිවැව එල්ලංගාව හා එහි පිහිටීම............................................................ | 4 |
| 1.2 | නෙලිවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා...................... | 7 |
| 1.3 | නෙලිවැව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු................................................ | 11 |
| 1.4 | නෙලිවැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම.... | 12 |
| 1.5 | එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම...................................................... | 13 |
| 1.6 | නෙලිවැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය............................. | 16 |
| 1.7 | නෙලිවැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය............................ | 16 |
| 1.8 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු........................................................................................... | 16 |
| 1.9 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම...................................................................................... | 17 |
| 2 | එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය............................ | 18 |
| 3 | එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීම දී අනුගමනය කල ක්‍රමවේදය.... | 19 |
| 3.1 | තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම............................................... | 21 |
| 3.2 | නෙලිවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හදුනා ගැනීම.................. | 22 |
| 4 | නෙලිවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ.................................................... | 23 |
| 4.1 | භූගෝලීය (Geographical ) තොරතුරු.......................................................... | 23 |
| 4.2 | භූ විද්‍යාත්මක (Geological) තොරතුරු.......................................................... | 24 |
| 4.3 | පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු............................................ | 24 |
| 4.4 | එල්ලංගාවේ පවතින ඉදිකිරීම්........................................................................ | 26 |
| 4.5 | නෙලිවැව එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය.................................... | 26 |
| 4.6 | එල්ලංගාව තුල මානව ජීවනෝපාය තොරතුරු............................................ | 31 |
| 4.7 | එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු......................................................... | 33 |
| 5. | එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග...................................................... | 40 |
| 6 | උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්....... | 41 |

07 එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තව - නෙලිවැව එල්ලංගා එල්ලංගාව........................................................................................ 48

## 01.හැඳින්වීම


ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල  මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි.  එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ " සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන්  සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

## 1.1 නෙලිවැව එල්ලංගාව හා එහි පිහිටීම

පුත්තලම  දිස්ත්‍රික්කයේ පුත්තලම මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටා ඇත. කරුවලගස්වැව එහි ප්‍රධාන උප නගරය ලෙස සැලකේ. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සාමාන්‍ය උන්නතාංශය මීටර් 85-200 පමන වේ. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ග කිලෝමීටර් 490ක විශාලත්වයකින් යුක්තය. වාර්ශික වර්ශාපතනය 760 මි.මි. – 1600 මි.මි. දක්වා වෙනස් වේ. නොවැම්බර් සහ දෙසැම්බර්  මාස වල වැඩිම වර්ශාපතන යුක්ත කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය උතුරු මායිමෙන්  කලා ඔය සහ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද, නැගෙනහිරින් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද (කුරුනැගල දිස්ත්‍රික්කය) දකුනින් ආනමඩුව සහ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ද බටහිරින් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ද දක්වා විහිදී යයි නෙලිවැව එල්ලංගාව  පිහිටියේ කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේය. මෙම එල්ලංගාව හෙක්ටයාර 5127.2 ක භූමි ප්‍රදේශයක් තුල ව්‍යාප්තව ඇත. එල්ලංගාවට ඊසාන දිග මෝසම් වර්ශාවේ ප්‍රතිපලයක් වශයෙන් වාර්ශික ඍතුමය ගං වතුරක් දක්නට ලැබේ. පුත්තලම සිට අනුරාධපුරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ පුත්තලම සිට කිලෝමීටර් 20 ක්  පමණ දුරින් පිහිටි මුරියා කඩවල  මංසන්දියෙන් දකුණු දෙසට දිවෙන මාර්ගයේ කි. මි. 5 ක් පමණ පැමිණීමෙන්  මෙම එල්ලංගාව හමුවේ.

රූපය 01 - කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටීම




මෙම එල්ලංගාවට ප්‍රදාන වශයෙන් ඓතිහාසික පසුබිමක් නොතිබෙන නමුත් 1978 දි පැමිනි මහා සුලි සුලගින් අනතුරුව ගොවීන් 13 දෙනෙකු මී ඔය ආශ්‍රිතව පැල් තනා ජීවත් වූහ. එම කාලයේදී කුඩා ප්‍රමානයේ වැව් සුලුතරයක් තිබූ අතර සා ගිනි නිවීමේ ව්‍යාපාරය මණ්ඩලය යටතේ වැව් වල කට්ටි කපා වැව් පුනරුත්ථාපනය කර තිබේ. එම කාලයේදී එක් කට්ටියකට රුපියල් 40.00 බැගින් මණ්ඩලය ලබා දුන් බව එල්ලාංගාවේ වෙසෙන ගොවීන් පවසයි. නෙලිවැව එල්ලංගාව උණුසුම් කලාපයේ පවතින ඉතා දුෂ්කර වූ එල්ලංගාවකි. ශ්‍රී ලංකාවේ ශුෂ්ක දේශගුණික කලාපයට අයත් මෙම එල්ලංගාවේ සාමාන්‍ය උෂ්ණත්වය 28 - 32 $^{o}$C අතර පවතී. උෂ්ණත්වය වර්ෂයේ දීර්ඝ කාලයක් තුළ දක්නට ලැබෙන අතර මාර්තු, අප්‍රේල්, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වලදී මෙම තත්වය ඉතා ඉහළ අගයක පැවතීම විශේෂයෙන් කැපී පෙනේ. නිරිත දිග මෝසම් සමයේ ලැබෙන වර්ෂාපතනය ඉතා සීමිතය. ඊට අමතරව සංවහන වැසි මඟින් ද මෙම එල්ලංගාවට වර්ෂාපතනය ලැබේ.

නෙලිවැව එල්ලංගාවේ වැව් ලේඛනය අනුව වැව් 11 කින් සහ අමුනු 04 කින් සමන්විතය. එයින් ප්‍රතිලාභ ලබන සෘජු ප්‍රතිලාභීන් 661 ක් පමන වේ. 648/A එගොඩපිටිය ග්‍රාම නිලදාරී වසමෙහි වැව් 4ක් සහ අමුණු 3ක් ද, 649 පලීගම ග්‍රාම නිලධාරී වසමේ වැව් 4 ක් පිහිටා තිබේ. වනය තුල පිහිටි වැව් සංඛ්‍යාව 09 කි.

වගුව අංක 01 - නෙලිවැව එල්ලංගාවට අයත් වැව්


| අනු අංකය | ග්‍රාම නි.වසම | වැවේ නම | ප්‍රතිලාභීන් ගනන | පිහිටීම | අක්කර ගණන |
|---|---|---|---|---|---|
| 648/A | එගොඩපිටිය | වලස් වැව | 32 | රක්ෂිතය තුල | |
| | | දේවාලකන්ද වැව | 48 | | |
| | | පන්සල් වැව | 65 | | |
| | | පෙරියවිල්ලුව වැව | 47 | | |
| | | තම්මැන්නාව වැව | 35 | | |
| | | සාලිය වැව | 33 | | |
| | | ජයන්ත වැව | 30 | රක්ෂිතය තුල | |
| 649 | පලීගම | මහනෙලිවැව | 400 | රක්ෂිතය තුල | |
| | | කෝන්ගොල්ල වැව | 20 | රක්ෂිතය තුල | |
| | | සීයබලා වැව | 62 | රක්ෂිතය තුල | |
| | | කල්ලගහපිටිය වැව | 7 | රක්ෂිතය තුල | |
| | | ගලපිට වැව | 5 | රක්ෂිතය තුල | |
| | | පලීගම වැව | 38 | රක්ෂිතය තුල | |
| | | කුඩා නෙලිවැව | 9 | රක්ෂිතය තුල | |
| | | කුඩා සියබලා වැව | 30 | රක්ෂිතය තුල | |
| | | | 861 | | |

මෙම වැව් අතීතයේ ඉතා කුඩා ජල මූලාශ්‍ර පදනම් කරගත් පුද්ගලිකව ඉදිකරන ලද වැව් පද්ධතියකි. පසු කාලීණව අදියර කිහිපයකින් වත්මන් තත්වය දක්වා සංවර්ධණය වී ඇත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග පැවති බවක් දක්නට නැත. එහෙත් කාලය හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට විනාශයට පත්ව ඇත. කට්ට කඩුව, ගස් ගොම්මන, පෙරහන යනාදී ඉතා වැදගත් අංගෝපාංග යෙදිය යුතුය. තවද වර්තමාන ගොවි ප්‍රජාව මෙම අංගෝපංග පිළිබදව හෝ මෙම අංගෝපංග එල්ලංගා පද්ධතිය තුල පිහිටා ඇත්තේ කුමන හේතුවකටද යන්න පවා අවබෝධයක් නැත. මෙම හේතු නිසා එල්ලංගාව හායනයට පත් වීම වර්ථමානයේදී විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ එල්ලංගාවේ වැව් ගොඩවීමයි.

## 1.2 නෙලිවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

කරුවලගස්වැව ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශය තුල  කුඩා පරිමාණයේ වැව් රාශියක්  පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් 3ක්  නියෝජනය කරයි. සුළු පරිමාණ  වැව් 133 ක් සම්බන්ධයෙන් එල්ලංගා පද්ධති 3ක්  කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇත. නෙලිවැව එල්ලංගාව, රබාවැව එල්ලංගාව, ඉහල රලපනාව එල්ලංගාව මෙම එල්ලංගාවන් වේ.

රූපය 02 - නෙලිවැව එල්ලංගාවේ භූමියේ පිහිටීම




නෙලිවැව එල්ලංගාවේ අක්කර 2730ක් හේන් ගොවිතැන් ප්‍රදේශ වන අතර අක්කර 8750ක් රක්ෂිත ප්‍රදේශ වේ. අක්කර 758ක් ලඳු කැලෑ වන අතර අක්කර 281 ක් වී වගාව සඳහා යොදා ගනී.

රබාවැව එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණයෙන් අක්කර 1849ක් ලඳු කැලෑ යටතේ පවතී. අක්කර 1923ක් ගෙවතු වගා යටතේ ද අක්කර 501ක් වී වගාව යටතේද තිබෙන අතර වැවට අයිතිව අක්කර 244ක් ද තිබේ. ඉහල රලපනාව එල්ලංගාවේ අක්කර 1925ක් වනාන්තර වන අතර අක්කර 1341ක් ලඳු කැලෑ යටතේ පවතී. අක්කර 22ක් වී වගාව යටතේ පවතින අතර අක්කර 48ක් වැව යටතේ පවතී.

විශාල වැව් පද්ධතියක් තිබෙන මෙම එල්ලංගා වල වැව් සියල්ල පුනරුත්තාපනයට භාජනය කල යුතු වුවත් ඒ සඳහා විශාල මූල්‍ය සම්පතක් අවශ්‍ය වේ. නෙලිවැව එල්ලංගාව් නිරීක්ෂනය කරන විට තව ලොකු හා කුඩා වැව් හමු වේ. මෙම සියලු වැව් වල වාර්ශිකව රැස් වන ජල දාරිතාවය සලකා බැලීම වැදගත් වේ. එල්ලංගාවට ලැබෙන සැම ජල අංශුවක්ම හැකි තරම් කාලයක් එල්ලංගාව තුලම රදවා තබා ගැනීමට සුදුසු පරිසරයක් පවත්වා ගැනීම එල්ලංගා කළමනාකරන සැලසුමේ ප්‍රදාන අරමුනකි. නෙලිවැව එල්ලංගාවේ ජලා ප්‍රවාහන රටාව සැලකීමේදී එය උතුරට ගොස් මී ඔයට ගලා යයි. රදවි (වාරි) ඇල ගමන් ගන්නේ ද මෙම එල්ලංගාව හරහා වන බැවින් එල්ලංගාවේ ඇති සමහර වැව් මෙම ඇලෙන් පෝශනය වේ.

නෙලිවැව එල්ලංගාව

රූපය 03 - නෙලිවැව එල්ලංගා පද්දතිය




පාශු වයනය සහ අන්තර්ගතය මත පදනම්ව කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන පාංශු වර්ග 02ක ව්‍යාප්තියක් පෙන්වයි.

අ) රතු පැහැයට හුරු දුඹුරු පස (RBE)
ආ) ඇලුවියල් පස

ජල මාර්ග අවට පහත් බිම්වල සහ කුඹුරුවල දක්නට ලැබේ.


නෙලිවැව එල්ලංගාව තුල මෙම පාංශු වර්ග 2 ම දක්නට ලැබේ. එල්ලංගාවේ සමස්ථ සිතියම හා දළ වශයෙන් සටහන් කර ඇති එල්ලංගා ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ගොවින්ගේ පදිංචියෙන් ප්‍රදේශයම ආවරණය කරයි. ඒ අනුව ගෙවතු වගාව හා වෙනත් මානව අවශ්‍යතාවන් සඳහා එල්ලංගාව යොදාගෙන ඇති බව පැහැදිලිව දක්නට ඇත. මේ අනුව මෙම එල්ලංගාව දැනටමත් ජනාකීර්ණ වී ඇති බවත් නිවාස හා වෙනත් ඉදිකිරීම් වලින් බහුල බවක් පෙන්වයි.

රූපය 04 - කරුවලගවැව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ පාංශු සැකැස්මේ විකාශය



නෙලිවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ පිහිටීම හා එල්ලංගාවේ දළ සීමාවන්

රූපය 05 - නෙලිවැව එල්ලංගාවේ භූමි භාවිතාව



## 1.3. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගු අංක - 03

| තොරතුරු | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | පුත්තලම |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කරුවලගස්වැව |
| මැතිවරණ බල ප්‍රදේශය | පුත්තලම |
| ගංගා ද්‍රෝණියේ නම | මී ඔය ගංගා දෝණිය |
| එල්ලංගාවේ නම | නෙලිවැව |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | තබ්බෝව |
| ග්‍රාම නිලධාරී වසම් | 2 |
| එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය | හෙක්. 5127.2 |
| ජලපෝශක ප්‍රදේශයේ නම | රදවි බැදි ඇල |
| පැහැදිළි ජල පෝෂක සංඛාව | 08 |
| කෘෂිකාර්මික කටයුතු සඳහා බාවිතා කරණ වැව් සංඛ්‍යාව | වැව් 10 හා අමුණු 04 |
| වනාන්තර ප්‍රදේශ | හෙක්. 500 |
| මුඩු බිම් | හෙක්. 15 (හදුනාගත්) |
| එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව | 831 |
| ගෙවතු | හෙක්. 50 |
| පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛාව | 6 |
| පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛාව | වැව් 5 හා අමුනු 4 |

## 1.4 නෙලිවැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

නෙලිවැව එල්ලංගාව හෙක්ටයාර් 5127.2 කින් සමන්විත වැව් 11 කින් සහ අමුණු 4 කින් යුක්ත වේ. මේ අතරින් වැව් 6 ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇත. මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර 3011ක් පමන වේ. මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් සංඛ්‍යව 750 ක් පමන වේ. මේ සමගම එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 3323 ක් පමන වාසය කරයි. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුෂික ක්‍රියාකාරකම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වන විනාශය, අවිධිමත් හේන් හා ගොඩ ඉඩම් වගාව නිසා සිදුවන පාංශු ඛාදනය, වැව් ඉස්මත්ත අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු වගා කිරීම වැනි ක්‍රියාකාරකම් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දීමට හේතවී ඇත. තවද මෙවන් කුඩා එල්ලංගාවක් වීමත් ජනගහන වර්ධනය හා ඉඩම් බෙදී යාමත්, පවතින සම්පත් දිනෙන් දින වේගයෙන් භාවිතයට ගැනීමත් නිසා මෙම ප්‍රදේශවල වැව් ජලය සීග්‍රයෙන් සිදී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් සිටී. ජල මාර්ග සිදී යමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමානවත් නොවේ. මෙම තත්වයට එකම විසදුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර ලෙස සංවර්ධනයට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර නෙලිවැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය නෙලිවැව එල්ලංගාව වෙත යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපාංග ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුව ඇත. එහි දී අනුගමනය කලයුතු ප්‍රධාන ක්‍රියාමාර්ග මෙසේය.

1. වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමානවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා කිරීම.
2. වැව් ඉස්මත්තේ සිදුකෙරෙන අණවසර වගාවන් නිසා සිදුවන ප්‍රබල පාංශු ඛාදනය අවම කිරීමට පියවර ගැනීම. මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගා කරන ගොවීන් ඉවත් කිරීම, වැව ඉස්මත්තේ හේන් වගා බිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම, වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter) යෙදීම. පවතින ගොඩ වල පුණරැත්ථාපනය හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින් වැවට ගලා එන ජලය මගින් ගෙන එන දැ අවම කිරීම. (වැව ගොඩවීමට බලපාන රොන්මඩ, වැලි සහ මැටි, ශාඛ හා සත්ව කොටස්)


3. වැවේ කට්ටකඩුව, ගස්ගොම්මන, ඉස් වැටිය යන අංගයන් නැවත පිහිටුවීම. වැවේ හා වාරිමාර්ග පද්ධතියේ නඩත්තුව විදිමත් පරිදි පවත්වාගෙන යාම. වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීති රීති අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
4. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව මගින් නිරන්තරයෙන් එල්ලංගාව අධීක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම හා අදාල වගකිවයුතු ආයතන වල ප්‍රමාණවත් මැදිහත් වීම.

## 1.5 එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම් ″එල්ලන්″ සහ ″ගාව″ යන්නයි. “එල්ලන්” යනු එල්ලෙන යන්නයි. “ගාව” යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

### එල්ලංගාවක ආකෘතියක්

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11කට අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 චක්‍ර ලේඛයට අනුව (ඇමුණුම 01) එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන




රූපය 06 - එල්ලංගාවක ක්‍රියාකාරිත්වය

සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

ඒවා නම්,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන
- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.

ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ  දක්වා ඇත.




රූපය 07- එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ ප්‍රධාන පාර්ශවකරුවන්

## 1.6 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩ සටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන - MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන - ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටුකිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.7 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා නෙලිවැව එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින්

යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම, එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් හා ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවක රුවන් දැනුවත් කිරීම.

## 1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

## 2 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

නෙලිවැව එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී පහත සදහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී. මෙම චාරිකාව කණ්ඩායම් 5 කින් යුක්ත විය. එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලද්දේ සරළ රේඛාවක් හරහා ගමන් කිරීමෙන් නොව බහු අශ්‍රයක් තුල (Polygon) නිරීක්ෂණය කිරීමයි. වඩාත් ගුණාත්මක දත්ත සපයාගැනීමේ අපේක්ෂාවෙන් හා එම දත්ත යොදාගෙන ගුණාත්මක වාර්ථාවක් ලබා ගැනීම මෙහි අරමුණ විය. මේ සදහා දත්ත සටහන් කරගැනීමට හැකියාව ඇති නිලධාරියකු ව්‍යාපෘතිය මගින් යොදා ගත් අතර මග පෙන්වීම සදහා ගොවි සංවිධාන නියෝජිතයන්, ගෙවි ජන සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම නිශ්පාදන සහකාර හා ග්‍රාම නිළධාරීන් මේ සදහා සහභාගි වූහ.

1 කන්ඩායම වලස්වැව හා පෙරියවිල්ලුව වැව ආශ්‍රිත කලාපය

2 කන්ඩායම දේවාලකන්ද හා ජයන්ති වැව ආශ්‍රිත කලාපය

3 කන්ඩායම නෙලිවැව හා සියබලා වැව ආශ්‍රිත ප්‍රදේශය

4 කන්ඩායම තම්මැන්න්නැව වැව හා සාලිය වැව ආශ්‍රිත ප්‍රදේශය

5 කන්ඩායම පන්සල් වැව හා පලීගම වැව ආශ්‍රිත කලාපය

රූපය 08 - ක්ශේත්‍ර චාරිකාව



කණ්ඩායම් 05 ක් මෙම චාරිකාවට සහභාගී විය. සැළසුම් කල බහු අශ්‍ර (Polygon) අනුව ක්ශේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙම කන්ඩායම් යොදාගන්නා ලදී. මෙම සැලැස්ම අනුව නෙලිවැව_එල්ලංගා පද්ධති සමස්ථ චාරිකාව කිලෝ මීටර් 12 කින් පමන යුක්ත විය. මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ඉදිරිපත් කර එම දත්ත වල නිවැදි තාවය තහවරු කර ගැනීමට අවශ්‍යවිය. ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩ මුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තව දුරටත් තහවුරු කරගනු ලැබීය. විශේෂයෙන්ම මෙම තොරතුරු එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වේ. තවද එල්ලංගාව පිළිබඳව අධ්‍යනය කරනු ලබන ආයතන හෝ ව්‍යාපෘති වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධනය සැලසුම් කිරීමේදී මෙම තොරතුරු බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 03 නෙලිවැව එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය නෙලිවැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම

ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම

(ii) ද්විතීය දත්ත එකතු කිරීම

(iii) හරස්කඩ වාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 3.1 තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම

රූපය 09 - කළමනාකරන රැස්වීම




එල්ලංගා ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව බහුඅග්‍ර අධීක්ෂණය වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම

(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ග කාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්ම සකස් කර ඇත.

## 3. 2 නෙලිවැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

නෙලිවැව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශිලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී.

ඒවා නම්,

1. භූගෝල විද්‍යාත්මක

2. භූ විද්‍යාත්මක

3. ජල විද්‍යාත්මක

4. පාරිසරික විද්‍යාත්මක

5. මානව හැසිරීම්

6. සමාජ ආර්ථික

7. කෘෂිකාර්මික

8. වාරිමාර්ග කළමණාකරන

9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි.

මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 4 නෙලිවැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

## 4.1 භූගෝලීය (Geographical) තොරතුරු

නෙලිවැව එල්ලංගාව පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක්ටයාර 5127.2 භූමි ප්‍රදේශයක් තුල පිහිටා ඇත. කරුවලගස්වැව එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ටශයෙහි සාමාන්‍ය උන්නතාංශය මීටර් 85-200 පමන වේ. ඉහලින් කරුවකගස්වැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, උතුරේ සිට කලා ඔය සහ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ටශය, නැගෙනහිරින් ගිරිභාව ප්‍රාදේශීය ලේකම් කොට්ටශය (කුරුනැගල දිස්තෘකය), දකුනින් ආනමඩුව සහ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ටශය, බටහිරින් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය දක්වාද දිවෙයි. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය වර්ග කිලෝමීටර් 490ක විශාලත්වයකින් යුක්තය.

## 4.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් 5127.2 කින් යුක්තය. ජනාවාස අතර ලදු කැලෑව මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. ජලාපවහන රටාව ප්‍රධාන වශයෙන් මී ඔය ගංගා ද්‍රෝණියේ හා සම්බන්ධ වන අතර එය වැව් මූලාශ්‍ර කර ගත් පද්දතියක් වේ. ප්‍රා.ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජල මාර්ග බොහෝ ස්ථානවල අවහිර කර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් හා අමුණු රාශියක් ඉදිකර ඇත. වැසි සමයේදී ජලය වේගයෙන් ගලා යාම නිසා දැඩි පාංශුඛාදනයක් සිදු වේ. මෙම ප්‍රා.ලේකම් කොට්ඨාශය තුළ ඇති මුළු කුඩා වැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරයි. වියළි කාලවලදී භූගත ජල මට්ටම අඩි 30 ක් පමණ ගැඹුරට දක්නට ලැබෙන අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබා ගනී. සංවහන වැසි වැටෙන විටදී කලු මිශ්‍ර දුඹුරු පැහැයෙන් යුත් ජලය ගලා යන අතර වගා කන්න වලදි වගා බිම් සැකසීමත් සමග ගලා යන ජලයේ වර්නය වෙනස් වේ. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතා කෙටි වන්නේ වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොමැති නිසාය.

## 4 .3 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගාව තුල වැව් 11 ක් පවතින අතර මෙම වැව් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්තිර බෝග වගාවන් ව්‍යාප්ත වී ඇත. බෙහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලේ පිහිටි කුඹුරු යායෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපාංග නැත. වාර්ෂිකව වැව් ඉස්මත්තෙ කුඹුරු වගාව නිසා පස සේදී පහලින් පිහිටි වැවට එකතු වන රොන්මඩ හා පස් අංශු අති විශාලය. මෙය වාර්ෂිකව සිදුවේ. මෙහි ඉස්වැටිය, පෙරණය, ගොඩවල නැත. වැව් ඉස්මත්ත මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වී ඇත .




රූපය 10 - වැව් බැම්ම

වැව ඇතුලත පැහැදිලිව  අනවසර කුඹුරු දක්නට ලැබේ. මෙම අනවසර ඉඩම් වලට තාවකාලික අනවසර බලපත්‍ර හෝ  ඔප්පු   නිතුත්කර ඇත. වැව ඉස්මත්ත පදිංචිය සඳහා භාවිතා කිරීමටත්, නොයෙකුත් අක්‍රමිකතා සඳහා බාවිතා කරමින්  වැව ගොඩකරන ගොවීන් ඇත.

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මෙම වැව් පද්ධති පුණරුත්ථාපනය කලද වර්ථමානය වන විට  වැව් හා අදාල පද්ධතිය සම්පර්ණණයෙන්ම වල්බිහි වී ඇත. ඊට අදාල වැව් මානා, ඉලුක් හා වෙනත් කැලෑවට යටවී ඇත. මුලු පරිසර පද්ධතියම මේ නිසා වල් බිහිවී ඇති අතර වන අලින්ට මෙය කදිම තෝතැන්නකි. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්ත කර ගැනීමට ගොවි සංවිධාන වලට අවශ්‍යතාවයක් හෝ හැකියාවක්  නොමැති බව මෙයින් පෙනේ. විශාල වියදමක් දරමින් කර ඇති අලුත්වැඩියාවන්  ඉතා කෙටි කලකින්  විනාශ වී යා හැකිය.

නෙළිවැව එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, මයිල, පලු, වීර, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා බහුලව දැකගත හැකිය. මීට අමතරව මෙම එල්ලංගාවේ ශ්‍රී ලංකානු අලියා, දිවියන්, මුවන්, වල් මීහරකුන්, වල් ඌරන්, වඳුරන්, මොණරුන් වැනි සතුන්ද ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන්ද දැකිය හැක. තවද  උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා  දැකිය හැක. තවද කැබැල්ලෑවන්, හම්බාවන් යන සත්වයින් ද එල්ලංගාව තුල ජීවත් වේ.




වැව් ආශ්‍රිතව මානව ක්‍රියාකරකම් හා පරිසර හානි විශාල වශයෙන් සිදුවේ. නමුත් මෙම වන රක්ෂිතය තුල සිදුවන  මානව ක්‍රියාකාරකම් හා පරිසර හානි වන සංරක්ෂණ නිළධාරීන් යම් ප්‍රමාණයකට පාලනය කරගෙන යනු ලබයි.

එල්ලංගාව තුල නිරන්තරයෙන් ගොඩනැගිලි  ඉදිවෙමින්  පවතී. වෘක්ෂලතා ආවරණය  පවතින්නේ 14% පමන වේ. වන සංරක්ෂණ  දෙපාර්තමේන්තුවට අයත්  වන සංරක්ෂණ කලාප සුලු වශයෙන් පැවතියද අනවසර දැව කැපීම් බහුල බව පරිසර අධ්‍යනයේදී ගම්යො විය.  ක්‍රමයෙන් සිදු වන මෙම ජනගහන වර්ධනයත් සමග එල්ලංගාව තුල තව තවත් වෙනස් භූමි දර්ශනයන් නිර්මාණය විය හැකිය. බොහො ඉඩම් එලිපෙහෙලි කිරීමත් සමග   නෙලිවැව එල්ලංගාව  අක්‍රීය වනු ඇත. මෙම තත්වය පාලනය කර ගැනීමට එල්ලංගා කළමනාකරණ කමිටුවටත්, ගොවීන් හා අනෙකුත් ප්‍රතිලාබීන්ගේත් සහයෝගය අත්‍යා අවශ්‍ය වේ. සතුන්ගෙන් සිදුවන හානිය (රිළවුන්, අලින්, මොණරුන් හා ඌරන් ) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂ ලතා සිටුවීම සම්බන්ධයෙන් දක්වන්නේ අකමැත්තකි. රිළවුන්,

මොණරුන් හා අලින්ගේ  ගැවසීම නිසා ගස් හා පඳුරු කපා දැමීමට ගොවීන් පෙලඹී ඇත. ඌරන් හා මුවන් අනවසර  දඩයම් කිරීම ද දැකිය හැකිය.

## 4.4 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාවේ විශේශිත ඉදිකිරිම් දක්නට නැත. එහෙත් ගම් වාසීන්ගේ නිවාස තැනීම සිදු වේ. මෙම ගොඩනැගිලි ඉදිවන්නේ ස්තිර ගොඩනැගිලි ලෙසිනි. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. මෙම වැට ගොවීන් විසින්ම සකස් කර ගන්නා ලද අවිදිමත් වැටකි. තවද ඉඩම් කැබලි වීමද වේගවත් ය. ගොඩ ඉඩම් වල සිදු වන පාංශු තට්ටු කැපීමල ලිං කැපීම සහ විවිද වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ සහ හදිසියේ ඇතිවන සංවහන වර්ශාව සිදුවන අවස්තා වලදී වේගවත්ව ජලය ගලා යාමත් සමග පාංශු ඛාදනයක් ඇති වේ. මෙම ඛාදනයත් සමග රොන් මඩ හා පාංශු කොටස් වැව් වල තැන්පත් වීම වැලැක්විය නොහැකිය. අවිදිමත් වගා බිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. ගඩොල් කැපීම ද දක්නට ඇත. සෑම වගා ඉඩමකම ගස්  උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ගැනීම ගොවීන් සිදුකර ඇත. වගාබිම් හා  බොහෝ අවදානම් ස්ථාන වල අලිවැට ඉදිකර ඇතත් මේවා විධිමත්ව ඉදිකරන ලද  වැටවල් නොවේ. අනතුරුදායක වැටවල්  ඒ අතර ඇත. එල්ලංගාව මුලුමනින්ම පාහේ ජනාවාස වලින් යුක්ත වන හෙයින් නිරන්තරයෙන් නිවාස ඉදි කිරීම සහ වැඩි දියුනු කිරීම් පවතී. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරකෂණ ක්‍රම අනුගමනය කලයුතුය.

## 4 .5  නෙලිවැව එල්ලංගාවේ වාරිමාර්ග  කළමනාකරණය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 11 ක් සහ අමුණු 4ක් පිහිටා තිබේ. එල්ලංගාවේ ජල කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත්කමක් ඇත. තරමක ගෙවතු ව්‍යාප්ත වී ඇත. බෙහොමයක් වැව් වල  කුඹුරු සීමාව  අවසන් වන්නේ  පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපාංග නැත. ජල පාලකවරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේදීය. ඇතැම් ජලපාලකයන් එක දිගට ම කිහිප වරක් පත්වෙන්නේ ගොවීනන්ගේ කැමැත්තෙනි. කන්න රැස්වීම අනුව වගාව ආරම්භ කර ජල මුර ක්‍රමයට ජලය නිකුත් කිරීම සිදු වේ. ගොවි සංවිදානයේ මැදිහත් වීම මත වැවේ ජලය බෙදා හැරීම සිදු වේ. වගා කන්නය සමග වාරිමාර්ග පද්දතිය නඩත්තු වන අතර සෙසු කාල වල නඩත්තුවක් නොමැත. ගොවි සංවිදාන වල ක්‍රියාකාරීත්වය වගා කන්නයට පමනක් සීමා වේ. එල්ලංගාව තුල ගොවි සංවිදාන 5ක් පිහිටුවා ඇත. ගොවි සංවිදාන රැස්වීම් වල සනපුරණය පිලිබදව ගැටලු පවතී. 50 % ක් පමන වයස්ගත පුද්ගලයන් මේවායේ නිලතල හොබවයි. මේ නිසාම නඩත්තුව හා මෙහෙයුම් පිලිබදව නව චින්තනයත්, ක්‍රියාකාරිත්වයත් සංවිදාන තුල දක්නට නැත. පද්ධතියේ

මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලක වෙත මුදල් ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිලිබඳව වගකීමක් නොගැනීමට හේතුවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ බෙත්මට වී වගා කෙරේ. මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබඳව දුර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහභාගිත්වයේ විශේෂ දුර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් නැත. තවද අරමුදල් වර්ධනය වීමක් ද නැත. සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

වගුව 04 - **එල්ලංගාවේ ගොවි සංවිධාන**

| අංක | වැවේ නම | ගොවීන් සංඛ්‍යාව | අක්කර | ගොවි සංවිධානය | පුණරුත්ථාපනය |
|---|---|---|---|---|---|
| 01 | තම්මැන්නාව වැව | 35 | | තම්මැන්නාව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 02 | ජයන්ති වැව | 30 | | ජයන්ති වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 03 | වලස් වැව | 32 | | වලස් වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 04 | පලීගම වැව | 38 | | පලීගම වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 05 | සියබලා වැව,<br>කුඩා නෙලි වැව,<br>මහ නෙලි වැව,<br>කෝන් ගහ වැව,<br>ගලපිට වැව,<br>කල්ලගහ වැව,<br>කුඩා සියබලා වැව | 482 | | එක්සත් ගො.ස | පුණරුත්ථාපනය කලා |


| | | | | | |
|---|---|---|---|---|---|
| 06 | සාලිය වැව | 33 | | සාලිය වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 07 | පෙරිය විල්ලුව වැව | 47 | | පෙරිය විල්ලුව වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 08 | දේවාලේකන්ද වැව, පංසල් වැව | 48 | | දේවාලේකන්ද වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 09 | පංසල් වැව | 65 | | පංසල් වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |
| 10 | නෙලි වැව | 40 | | නෙලි වැව ගො.ස | පුණරුත්ථාපනය කලා |

මූලාශ්‍රය ගොවි සං. - තබ්බෝව


වගුව 05 - ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය

| | Average Monthly Rainfall (mm) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Month | Anamaduwa Dispensary | Atharagalla | Dewahuwa | Giribawa | Inginimitiya | Karandipooval | Kottukachchiya | Maha Uswewa | Mahagalkadawala | Mediyawa Tank | Puttalam | Siyambalangamuwa | Tabbowa Irrigation |
| Jan | 46 | 48 | 124 | 49 | 68 | 44 | 36 | 44 | 72 | 85 | 49 | 58 | 49 |
| Feb | 35 | 30 | 96 | 35 | 46 | 40 | 32 | 34 | 49 | 52 | 40 | 51 | 35 |
| Mar | 84 | 61 | 73 | 45 | 64 | 57 | 83 | 61 | 72 | 104 | 54 | 50 | 70 |
| Apr | 176 | 153 | 176 | 123 | 196 | 120 | 167 | 151 | 199 | 214 | 136 | 152 | 151 |
| May | 122 | 82 | 85 | 70 | 79 | 91 | 114 | 86 | 86 | 105 | 94 | 65 | 106 |
| Jun | 47 | 17 | 29 | 13 | 19 | 25 | 47 | 18 | 17 | 39 | 27 | 12 | 34 |
| Jul | 21 | 9 | 21 | 8 | 18 | 13 | 25 | 10 | 20 | 22 | 10 | 16 | 17 |
| Aug | 35 | 27 | 27 | 21 | 29 | 15 | 33 | 26 | 35 | 37 | 20 | 26 | 30 |
| Sep | 71 | 56 | 64 | 57 | 74 | 57 | 60 | 52 | 84 | 77 | 68 | 62 | 62 |
| Oct | 269 | 233 | 280 | 192 | 233 | 227 | 262 | 221 | 239 | 297 | 241 | 227 | 234 |
| Nov | 225 | 235 | 288 | 174 | 225 | 219 | 238 | 225 | 241 | 265 | 238 | 231 | 202 |
| Dec | 129 | 140 | 258 | 122 | 158 | 131 | 118 | 138 | 165 | 176 | 136 | 142 | 116 |

| වසර | වාර්ෂික වර්ෂාපතනය (මි.මී.) | දරුණු ගංවතුර සිදුවීම් | වාර්ෂික මධ්‍යනය උෂ්ණත්වය (0C) | දරුණු නියගය |
|---|---|---|---|---|
| 2009 | 956.9 | | 27.83 | |
| 2010 | 1333.9 | | 28.08 | |
| 2011 | 826.3 | | 27.8 | දරුණු නියගය |
| 2012 | 1141.2 | දරුණු ගංවතුර | 28.09 | ඔක්තෝබර් දක්වා දැඩි නියගයක් |
| 2013 | 905.1 | | 27.9 | |
| 2014 | 1696.6 | | 27.9 | දරුණු නියගය |
| 2015 | 1664.3 | | 27.6 | දරුණු නියගය |
| 2016 | 939 | දරුණු ගංවතුර | 28.3 | |
| 2017 | 819.2 | | 28.3 | |
| 2018 | 1419.2 | | 27.8 | |
| 2019 | - | නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දරුණු ගංවතුරක් | - | |
| දත්ත මූලාශ්‍ර: කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ සහ ජනතාක්ෂණ 2019/2020 ප්‍රතිඵල | | | | |




ප්‍රස්තාර 02 - මාසික වර්ශාපතනය (කරුවලගස්වැව)





ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගු ව තුලින් දක්වා ඇත. දැනට එල්ලංගාවේ පිහිටි සෑම වැවකම ජලය බෙදා දීම මුර ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර ඒ අනුව එක් එක් ගොවියාට පැය කිහිපයක් පමණක් ජලය ලබාදේ. ඇල පද්ධතියේ දුර්වලතා දක්නට ඇත. මේ නිසා ජල කළමනාකරණයක් කල නොහැකිය. එහෙත් ඇතැම් ගොවීන් තම අභිප්‍රාය අනුව ජලය ලබාගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව්වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත. විශේෂයෙන්ම වගා කරන කන්න වල පමණක් ගොවි සංවිධාන

ක්‍රියාත්මක වන අතර බොහෝ ගොවි සංවිධාන නිලධාරීන්ට පමණක් සීමා වී ඇත. විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ වේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරීන් පවසති. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය.

### 4.6 එල්ලංගාව තුල මානව ජීවනෝපාය තොරතුරු

නෙලිවැව එල්ලංගාවේ මුළු ජනගහනයෙන් 1819ක් කාන්තා ජනගහනය වන අතර, 1504 ක් පිරිමි ජනගහනය වේ. මුළු ජනගහනයෙන් 1287ක් වයස අවුරුදු 18ට වඩා අඩු වන අතර අවුරුදු 18 - 65 අතර 2092ක් ද, අවුරුදු 65ට වැඩි පිරිස 3885ක් ද වේ. නෙලිවැව එල්ලංගාවේ 48.77% පමණ කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සිදු කරයි.

ප්‍රස්ථාර අංක 03 - එල්ලංගාවේ ජනගහන ව්‍යාප්තිය




දත්ත මූලාශ්‍රය - PRA ප්‍රතිඵල 2019 - ජනතාක්ෂණ විසිනි

එමෙන්ම රැකියා නියුක්තියේ සංයුතිය පහත දත්ත අනුව පෙන්නුම් කෙරේ.


- 4.12% - රාජ්‍ය සේවකයින්
- 21.3% - පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිකයන්
- 8.1% - ව්‍යාපාරික ප්‍රජාව
- 2.72% - දෛනික වැටුප් ලබන්නන්

- 7.6% - ස්වයංරැකියා නියුක්තිකයන්
- 3.08% - වෙනත්

ඒ අනුව ප්‍රධාන මානව ක්‍රියාකාරකම් අතරින් ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක.

ප්‍රස්තාර 04 - එල්ලංගාවේ ජනගහනය තුල රැකියා ව්‍යාප්තිය

දත්ත මූලාශ්‍ර - කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 ජනතාක්ෂණ සහ සම්පත් පැතිකඩෙන් PRA ප්‍රතිඵල





මීට අමතරව ස්වයං රැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රදේශය පුරා ව්‍යාප්තව ජීවත්වන අතර නිම් ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, කළුගල් කැඩීම වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි. එල්ලංගාව තුළ බොහෝ විට ගෙවතු වගාවක් දක්නට ලැබේ. ඒ සඳහා භූගත ජල සම්පත් යොදාගෙන ඇත. සතුන් දඩයම් කිරීම එල්ලංගාව තුළ අප්‍රසිද්ධියේ සිදු වේ. ඌරන්, මුවන් දඩයම් කරන බවත් එම මස් හොර රහසේම අලෙවි කරමින් මුදල් උපයා ගන්නා බවට තොරතුරු ලැබී ඇත. ගඩොල් කැපීම එල්ලංගාව තුළ ස්ථාන කිහිපයකම සිදු වේ.

## 4.7 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි පවුල් සංඛ්‍යාව 831.
මෙහි සමස්ථ ජනගහනය 3324 පමණ වේ.


ප්‍රස්ථාර අංක 05 - එල්ලංගාවේ ගැහැනු පිරිමි ජන ව්‍යාප්තිය




දත්ත මූලාශ්‍රය - PRA ප්‍රතිඵල, 2019/2020 - ජනතාක්ෂණ විසින්

ප්‍රස්තාර 06 - එල්ලංගාව තුල ආගමික ව්‍යාප්තිය

නෙලිවැව එල්ලංගාවේ 98.1% බෞද්ධ ජනතාව වන අතර 1.9% කතෝලික ආගමික ප්‍රජාව වේ.





දත්ත මූලාශ්‍රය - PRA ප්‍රතිඵල, 2019/2020 - ජනතාක්ෂණ විසිනි

මෙම එල්ලංගාව තුළ මුල් යුගයේ ඉතා සීමිත ජනගහනයක් පදිංචිව ඇත. මුල් යුගයේ සාර්ථකව කුඹුරු වගා කර ගත් බවත් ජලය ප්‍රමාණවත් වූ බවත් පැරණි ගොවීන් පවසයි. එහෙත් වර්තමානයේ මෙම තත්වය සීග්‍රයෙන් වෙනස් වී ඇත. වැවෙහි ජලය රඳා පැවතීමක් නැත. පෝෂක ප්‍රදේශ වියලී ගොසින්ය. ජල මාර්ග හිදීගොස් ඇත. ඉඳි, තල් වැනි ශුෂ්කකාමී ශාක හා පඳුරු වර්ධනය වෙමින් පවතී. රජයේ විවිධ ආධාර වැඩසටහන් ව්‍යාපෘති මගින් ප්‍රදේශයේ ජනතාවට සුළු වශයෙන් සහන ලබා සලසනු ලබයි. නියමිත කන්නයේ කුඹුරු 100% වගා කළ නොහැකිය. අතීතයේ පැවති තාවකාලික නිවාස හා ජනාවාස ක්‍රමයෙන් වැඩිදියුණු වී ඇත.

වගුව 06 - එල්ලංගාව තුල පවුල් වල මාසික අදායම

| මාසික පවුලේ ආදායම (රු.) | මුළුපවුල් | ප්‍රතිශතය |
|---|---|---|
| 0 - 3,999 | 3016 | 31% |
| 4,000 - 7,999 | 2563 | 27% |
| 8,000 - 11,999 | 2096 | 22% |
| 12,000 - 15,999 | 742 | 8% |
| 16,000 - 19,999 | 458 | 5% |
| 20,000 - 23,999 | 258 | 3% |
| 24,000 - 27,999 | 258 | 3% |
| 28,000 - 31,999 | 149 | 2% |
| 32,000< | 124 | 1% |
| Total | 9664 | 100% |
| | | |
| දත්ත මූලාශ්‍රය - PRA ප්‍රතිඵල, 2019/2020 - ජනතාක්ෂණ විසිනි | | |

ප්‍රස්තාර 07 - එල්ලංගාව තුල පවුල් වල මාසික ආදායම




කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයම ආවරණය වන පරිදි ආදායම් මට්ටම සලකා බැලීමේදී ඉහත වගු සටහන හා ප්‍රස්ථාරය අවධානය යොමු කරමි. නෙලිවැව එල්ලංගාව හා ඊට අදාල ප්‍රජාවගේ ආදායම් තත්වයද සැලකිල්ලට ගත යුතුය. ප්‍රදේශයේ ජනගහනයෙන් 31% කගේ ආදායම 3999 කි. ජනගහනයෙන් 22% කගේ ආදායම වන්නේ 8000 -11999 අතර වේ. මේ අනුව ජනගහනයෙන් හරි අඩකඩ වැඩි ප්‍රමානයක ඇත්තේ 4000 - 7999 අතර ආදායමකි. 300000 වැඩි ආදායමක් ලබන්නේ 1% වැනි සුලු ප්‍රමාණයකි.

එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

වගුව 07 - වී වගාවේ ව්‍යාප්තිය


| කන්නය | අස්වැද්දුමකරණය කිරීමට (හෙක්ටයාර) | අස්වැද්දුම (හෙක්ටයාර) | වී නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|---|
| 2018 - යල | 3990.15 | 2612.1 | 12226.12 |
| 2017 - මහා | 3990.15 | 1144 | 4811.42 |

කෘෂිකර්මාන්තය ප්‍රධාන කොටගත් ආදායම ඉහත වගු සටහනින් දක්වයි. නෙලිවැව මහ කන්නයේ හෙක්. 1144ක් වගාකර ලබාගන්නා ආදායයයම මෙ.ටො. 4811.42 කි. මෙලෙස යල කන්නයේදී එල්ලංගාව තුල වී අස්වැන්න හෙක් 2612.1 කට මෙ.ටො. 12226.12 දක්වා ඉහල නගී. ප්‍රදේශයේ වී වගාව සඳහා ප්‍රධාන ජල මූලාශ්‍ර 03ක් ඇත. ප්‍රධාන, කුඩා වර්ශාපතනය ඒවා වේ. ඒ අනුව යල කන්නයේදී හෙක්ටයාර 1474ක් සහ මහ කන්නයේදී හෙක්ටයර 669.4කට මහා වාරි මගින් ජලය සපයයි. සුලු වාරි මාර්ගද ඉතා වැදගත් කාර්යය භාරයක් ඉටු කරයි. යල කන්නයේදී හෙක්ටයාර 1119.7ක් සහ මහ කන්නයේදී හෙක්ටයර 412.9කට සුලු වාරි මගින් ජලය ලබාදේ. වර්ශාපතනය බොහෝ දුරට මහ කන්නයට සීමා වී හෙක්ටයර 61.47ක් වගා කරයි.

වගුව 08 - එල්ලංගාව තුල වී වගාවේ භූමි ප්‍රමාණයන්


| වාරිමාර්ග ක්‍රමය | 2017 මහා වගා කරන ලද (හෙක්ටයාර) | 2018 යල වගා කරන ලද (හෙක්ටයාර) | යල කන්නයේ අස්වැන්න (MT) | මහ කන්නයේ අස්වැන්න (MT) |
|---|---|---|---|---|
| ප්‍රධාන | 669.4 | 1487.6 | 2744.54 | 7147.76 |
| සුලු | 412.9 | 1119.7 | 1815.29 | 4858.68 |
| වැසි පෝෂණය | 61.7 | 4.8 | 251.41 | 19.68 |
| වෙනත් | 0 | 0 | 0 | 0 |
| මුළු | 1144 | 2612.1 | 4811.24 | 12026.12 |

ප්‍රස්තාර 08 - එල්ලංගාවෙ කන්න කාල සීමා වල දි සිදු කරන වී වගා භූමි ප්‍රමානයන්




අතිරේක බෝග ලෙස බඩ ඉරිඟු, රට කජු, මුං ආදියද පළතුරු ලෙස කෙසෙල්, පැණි කොමඩු අදිය ද ඊට අමතරව පොල් වගාව ද ප්‍රදේශය තුල දක්නට ලැබේ.

ප්‍රස්තාර 09 - එල්ලංගාව තුල බෝගවගා ව්‍යාප්තිය




බඩ ඉරිගු සහ රටකජු ප්‍රදේශයේ වඩාත් ජනප්‍රිය ධාන්‍ය වේ. දේශගුණය, පස සහ ලාභය මෙයට බලපායි. රටකජු සහ බඩ ඉරිගු හෙ.1.25ක වගා කර ඇත. සමහර ගොවීන්ට කුඹුරු ඉඩම් නොමැති නිසා ඔවුන් පශු සම්පත් (කිරි ගොවිතැන) වලට නැඹුරුතාවයක් දක්වයි. බොහෝ විට බෞද්ධ ගොවීන් කිරි ගොවිතැනට බෙහෙවින් කැමතිය. ඔවුන් සතුව කිරි සඳහා ගවයින් 6925ක් පවුල් 1064ක් විසින් ඇඩි කරනු ලබයි. මුලු මාසික නිශ්පාදනය ලීටර් 69230 ඉක්මවයි. සමහර ගොවිපොලවල් වල එළුවන්, ඌරන්, කුකුලන් වැනි සතුන් ඇති කරනු ලබයි. 2018 සංක්‍යාලේකන වලට අනුව කුකුලු ගොවිතැන වඩාත් ප්‍රචලිත වන්නේ බෝග වගාව සඳහා ජලය නොමැති නිසා ය. කුකුලු ගොවිපලවල් 85ක කිකිලියන් 5000කට වැඩි ප්‍රමානයක් ඇති කරනු ලබයි. මාසික බිත්තර නිශ්පාදනය බිත්තර 50000 ඉක්මවයි. මිල උච්චාවචනය පිලිබඳව ඔවුන් පිලිකුල් සහගත බැවින් මේ සඳහා විශේශ අවදානයක් යොමු කල යුතුය.

## 05 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

නෙලිවැව  එල්ලංගාවේ පැවති හරස්කඩ චාරිකාවේ දී මෙන්ම ගොවි සංවිධාන හා  නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය .

එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේ දී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකි විය. මෙසේ හදුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්වන ආයතන පිළිබදව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තවක් සකස් කර කාල රාමුවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටවට ඉදිරිපත් කර සාකච්ජා කර ක්‍රියාවට නැංවිය යුතුය. මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීමට ගොවිජන සංවර්දන දෙපාර්තමේන්තුව හා ගොවි සංවිධාන මූළිකත්වය ගත යුතුවේ. එමෙන්ම එල්ලංගා කළමනාකරණ කමිටුවේ මූළිකත්වය ද ප්‍රධානවේ.

1. කුඹුරු බිම් වලට යාමට නිශ්චිත මාර්ගයක් නොමැති වීම.
2. වැවේ ඉස්මත්ත අල්ලා ගෙන තිබිම (රක්ශිත නිදහස් කිරිම).
3. වැව් ජලජ ශාක වලින් වැසී ගොස් ඇත.
4. කට්ටකඩුව ගස් නොමැත.
5. ගොඩවල නැත.
6. පෙරහන නැත.
7. පෙරිය විල්ලුව හා දේවාල කන්ද වැවේ වාන් ඇල බාදනය.
8. වලස් වැවේ වාන් ඇල අවහිරයි.
9. වැව් පුනරුත්තාපනයෙන් පසු වාන පහත් කර ඇත.
10. වැවේ රොන් මඩ නිසි අයුරින් ඉවත් කර නොමැත.
11. නැවත වන වගාව සිදු කල යුතුය.
12. ෆාම් හිල් ඉදිකිරීම් සමාගමෙන් ඉදිකල වැව් වල අඩුපාඩු රැසකි.
13. මිරිදිය මත්ස්‍ය වගාව නොමැත.

# 6 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් නෙලිවැව එල්ලංගාව

වගු අංක 11 - නෙලිවැව එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ ක්‍රියාත්මක සැලැස්මේ සංෂිප්ත වාර්තාව

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්විය යුත ආයතන |
|---|---|---|---|
| 1 | කුඹුරු බිම් වලට යාමට නිශ්චිත මාර්ගයක් නැත .<br><br>(වලස් වැව 2 කි.මී<br>පෙරිය විල්ලුව 2.5 කි.මී<br>දේවාලකන්ද 1.2 කි.මී<br>ජයන්ති වැව 2.5 කි.මී<br>නෙලිවැව 400 මී.<br>සියම්බලාවැව 600 මී.<br>තම්මැන්නාව 3 කි.මී<br>සාලිය වැව 4 කි.මී) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. ක්ෂත්‍රය පරික්ශා කිරිම<br>3. ඇස්තමේන්තු කිරීම<br>4. ගොවි සංවිදාන මගින් අලුත්වැඩියා කිරීම | 1. CSIAP<br>2. ගොවිජන සං.දෙ.<br>3. ප්‍රාදේශීය සභාව |
| 2 | වැවේ ඉස්මත්ත රක්ශිත අල්ලා ගෙන පෙරහන නැත<br><br>(පෙරිය විල්ලුව 10 අක්.<br>පංසල් වැව 1 අක්.<br>වලස් වැව 5 අක්.<br>සාලිය වැව 3 අක්.<br>තම්මැන්නාව 2 අක්.) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම<br>3. ගොවීන් දැනුවත් කිරීම<br>4. ගොවීන් සමග රක්ෂිත වෙන්කිරීම<br>5. සලකුණු කිරීම හා සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම<br>6. නිරන්තර අධීක්ෂණය | 1. ප්‍රා.ලේ.<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. පොලිසිය |
| 3 | වැව් ජලජ ශාක වලින් වැසී ගොස් ඇත.<br><br>සියලුම වැව් (90% ක් පමන) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල වැව් හදුනා ගැනීම<br>3. කෘ.දෙ. උපදෙස් ලබා ගැනීම<br>4. ඇස්තමේන්තු කිරීම<br>5. සුදුසු කෘමිනාශකයක් යෙදීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP / (CMC)<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. කෘ.දෙ. |
| 4 | කට්ටකඩුව ගස් නොමැත.<br><br>(දේවාල කන්ද<br>පන්සල් වැව පලියගම<br>සාලිය වැව තම්මැන්නාව<br>ජයන්ති වැව) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල ස්ථාන හදුනා ගැනීම<br>3. ගොවි සංවිදාන සහ අදාල ගොවීන් දැනුවත් කිරීම<br>4. ඒකාබද්දව කට්ටකඩුව වෙන් කිරීම<br>5. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සදහා පැල සිටුවීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP / (CMC<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරි.දෙ. |

| | | | |
|---|---|---|---|
| 5 | ගොඩවල නැත.<br>(ජයන්ති වැව<br>තම්මැන්මනාව<br>පලිගම වැව<br>සියබලැව) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල ස්ථාන හදුනා ගැනීම<br>3. ගොවි සංවිදාන සහ අදාල ගොවීන් දැනුවත් කිරීම<br>4. ගොඩවල වෙන් කිරීම හා නඩත්තු කිරීම<br>5. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම | 1. ගොවි සංවිධාන (CMC)<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ. |
| 6 | වාන් ඇල අවහිරයි.<br>(පෙරිය විල්ලුව හා දේවාල කන්ද<br>වලස් වැවේ වාන් ඇල<br>බාදනය 150 මී. පමන) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. තාක්ෂණික නිරීක්ෂණය<br>3. ඇස්තමේන්තු කිරීම<br>4. ගොවි සංවිදාන මගින් අලුත්වැඩියා කිරීම | 1. CMC/ CSIAP<br>2. ගොවිජන සං.දෙ.<br>3. පළාත් වාරිමාර්ග දෙ.<br>4. ගොවි සංවිධාන |
| 7 | වැවේ රොන් මඩ ඉවත් කර නැත.<br>(පෙරියවිල්ලුව 2000 කියුබ්<br>සාලිය වැව 2000 කියුබ්) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල වැව් හදුනා ගැනීම<br>3. තාක්ශනික උපදෙස් හා අස්තමේන්තුවක් ලබා ගැනීම<br>4. ගොවි සංවිදාන මගින් ඉටු කිරීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ. |
| 8 | වැව ඉස්මත්තේ හා අවට වණ ආවරණ නැත.<br>(ජයන්ති වැව<br>පංසල් වැව<br>පෙරියවිල්ලුව වැව) | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. ක්‍ෂත්‍රය හදුනා ගැනීම හා තක්සේරු කිරීම<br>3. වියදම් ලැයිස්තුවක් සෑදීම<br>4. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම | 1. CMC / CSIAP<br>2. ගොවිජන සං.දෙ.<br>3. වන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ගොවි සංවිධාන |
| 9 | පුනරුතාපනයෙන් පසු වැව් වල බොහොමයක් අඩුපාඩු පැවතීම.<br>(වලස් වැව<br>සාලිය වැව<br>පලිගම වැව) | 1. CMC සාකච්ජා කිරීම<br>2. අඩුපාඩු ලේඛනගත කිරීම<br>3. ව්‍යාපෘතියට ඉදිරිපත් කිරීම්<br>4. අඩුපාඩු සකස් කිරීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ. |
| 10 | මිරිදිය මත්ස්‍ය වගාව<br>නොමැත. | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. අදාල වැව් හදුනා ගැනීම<br>3. මිරිදිය මත්ස්‍ය පැටවුන් මුදා හැරීම<br>4. ගොවි සංවිධාන වලට භාරදීම | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. ජලජ ජීවී වගා සංවර්ධන අධිකාරිය |

| | | | |
|---|---|---|---|
| 11 | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්තු ඉතා දුර්වලයි. | 1. CMC හිදී සාකච්ජා කිරීම<br>2. නඩත්තු වැඩසටහනක් සැලසුම් කිරීම<br>3. ගොවීන් දැනුවත් කිරීම<br>4. නඩතු අරමුදලක් ගොඩ නැගීම<br>5. ගොවි සංවිධානය මගින් නඩත්තුව පවත්වාගෙන යාම | 1. CMC / CSIAP<br>2. ගොවිජන සං.දෙ. |

වගු අංක 13 - යෝජිත උපායමාර්ගික සැලැස්ම, දළ ඇස්තමේන්තු කාල රාමුව - නෙලිවැව එල්ලංගාව

| උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම් | දළ පිරිවැය (රු. මි.) | කාලරාමුව - 2025 | | | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෙටි කාලීන | | | | | | මධ්‍යකාලීන | | | | දිගුකාලීන | | | | | |
| | | | | | | | | | | | | | | | | ප්‍රධාන | අනෙකුත් |
| 1<br>කුඹුරු බීම් වලට යාමට නිශ්චිත මාර්ගයක් නැත. | 0.3 | | | | | | | | | | | | | | | 1. CSIAP /CMC<br>2. ගොවිජන සං.දෙ.<br>3. ප්‍රාදේශීය සභාව | ගොවි සංවිධාන |
| 2<br>වැවේ ඉස්මත්ත රක්ශිත අල්ලා ගෙන ඇත.<br>පෙරහන නැත. | 0.2 | | | | | | | | | | | | | | | 1. ප්‍රා.ලේ.<br>2. CSIAP<br>3. ගොවි සං.දෙ.<br>4. පළාත් වාරි.දෙ. | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3<br>වැව් ජලජ ශාක වලින් වැසී ගොස් ඇත. | 0.3 | | | | | | | | | | | | | | | 1. ගොවි විධාන<br>2. CSIAP/ CMC<br>3. ගොවි සං.දෙ.<br>4. පළාත් වාරි.දෙ.<br>5. කෘ.දෙ. | ගොවි සංවිධාන |
| 4<br>කට්ටකඩුව ගස් නොමැත. | 0.2 | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP/ CMC<br>3. ගොවි සං.දෙ.<br>4. පළාත් වාරි දෙ. | වන සං.දෙ. |
| 5<br>ගොඩවල නැත. | 0.5 | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP /CMC<br>3. ගොවි සං.දෙ.<br>4. පළා වාරි දෙ. | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6<br>වාන් ඇල අවහිරයි. | 0.2 | | | | | | | | | | | | | | | 1. CMC/ CSIAP<br>2. ගොවිජන සං.දෙ.<br>3. පළාත් වාරි දෙ.<br>4. ගොවි සංවිධාන | 1. ගොවි සංවිධාන<br>2. පළාත් වාරි දෙ. |
| 7<br>වැවේ රොන් මඩ ඉවත් කර නැත | 0.2 | | | | | | | | | | | | | | | 1. CSIAP/ CMC<br>2. ගොවිජන සං.දෙ.<br>3. පළාත් වාරි දෙ.<br>4. ගොවි සංවිධාන | |
| 8<br>වැව ඉස්මත්තේ හා අවට වණ ආවරණ නැත. | 0.2 | | | | | | | | | | | | | | | 1. CMC/CSIAP<br>2. ගොවිජන සං.දෙ.<br>3. වන සං.දෙ.<br>4. පළාත් වාරිමාර්ග දෙ.<br>5. ගොවි සංවිධාන | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 9<br>පුනරුත්ථාපනයෙන් පසු වැව් වල බොහොමයක් අඩුපාඩු පැවතීම පැවතීම. | 0.7 | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවි සං.දෙ.<br>4. පළාත් වාරි දෙ. | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරි.දෙ. |
| 10<br>මිරිදිය මත්ස්‍ය වගාව නොමැත. | 0.15 | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. ජලජ ජීවී වගා සංවර්ධන අධිකාරිය | 1. ගොවි සංවිධාන<br>2. CSIAP<br>3. ගොවිජන සං.දෙ.<br>4. පළාත් වාරි.දෙ. |
| 11<br>වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත නඩත්තු ඉතා දුර්වලයි. | 0.2 | | | | | | | | | | | | | | | 1. ගොවි සංවිධාන<br>2. CMC/CSIAP<br>3. ගොවිජන සං.දෙ. | ගොවි සංවිධාන |

07 එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තුව - නෙලිවැව එල්ලංගාව

| අනු අංක | දළ ඇස්තමේන්තුගත වියදම සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් - තම්මැන්නාව එල්ලංගාව | ආසන්න වියදම් (රු.මි) | 2024 - 2025 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඔ/ නො | දෙ/ ජ/ නො | මා/ අප්‍රි | මැ/ ජ | ජ/ අ | සැ/ ඔ | නො / දෙ | |
| 1 | කුඹුරු බිම් වලට යාමට නිශ්චිත මාර්ගයක් නැත. | 0.3 | | | | | | | | |
| 2 | වැවේ ඉස්මත්ත රක්ශිත අල්ලා ගෙන ඇත.පෙරහන නැත. | 0.2 | | | | | | | | |
| 3 | වැව් ජලජ ශාක වලින් වැසී ගොස් ඇත. | 0.3 | | | | | | | | |
| 4 | කට්ටකඩුව ගස් නොමැත. | 0.2 | | | | | | | | |
| 5 | ගොඩවල නැත. | 0.5 | | | | | | | | |
| 6 | වාන් ඇල අවහිරයි. | 0.2 | | | | | | | | |
| 7 | වැවේ රොන් මඩ ඉවත් කර නැත. | 0.2 | | | | | | | | |
| 8 | වැව ඉස්මත්තේ හා අවට වන ආවරණ නැත. | 0.2 | | | | | | | | |
| 9 | පුනරුතාපනයෙන් පසු වැව් වල බොහොමයක් අඩුපාඩු පැවතීම පැවතීම. | 0.7 | | | | | | | | |
| 10 | මිරිදිය මත්ස්‍ය වගාව නොමැත. | 0.15 | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත. නඩත්තු ඉතා දුර්වලයි. | 0.2 | | | | | | | | |
| | මුළු එකතුව | 3.15 | | | | | | | | |

ඇමුණුම්

ඇමුණුම් 01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
## கமநல அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.08.03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

**i.** එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

**ii.** වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම් කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සෑම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## 3.4. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවේ සංයුතිය

### 3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරි
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරි
ix. ආර්ථික සංවර්ධන නිලධාරි
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරි
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ ඒකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**3.5. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**3.6. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඊ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය

xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය

xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය

xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය

xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP

xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)